# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,886 — 1969 දෙසැම්බර් 26 වැනි සිකුරාද — 1969.12.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(මෙහි වෙනම ගොනුකාර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවෙනව වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 263 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන — | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... — | 264 | විවිධ දැන්වීම් — — | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... — | — | | |



සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශක වරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇල්විටන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ ශමාගම රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරි දිනකම දහයේ සිට හතර දක්වා ද, සෑම වරුවේ දිනවල දහයේ සිට එක දක්වා ද ලේඛණ පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල සවස 3 දක්වා ද, වරුවේ දිනවල දවල් 12 දක්වා ද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියා පදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක් සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

සතිපතා ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1969 දෙසැම්බර් මස 14 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

263—බී 69531—9,030 (69,12)

0 1

### විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුඩවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නොකරන ලද හෝ ලාංඡික මුද්දරයක්ද සමඟ ටී. ඇම්. 7 දරණ පෝර්ම මඟින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම්කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගැනීමට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම දැරීමට පෙර සැහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

## වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන

### ශුද්ධියක්

1969.2.21 දින හා අංක 14,842 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරන ලද, 3 වන පන්තියේ, අංක 30,564 හා 1968.8.23 දින දරණ වෙළඳ ලකුණ සම්බන්ධ දැන්වීමේ අංක (2) පහත සඳහන් අයුරු නිදොස් විය යුතුයි :—

1968 අගෝස්තු මස 23 දින.

ජේ. ඒප්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

1969 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ 1,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

12-1229

### ශුද්ධියක්

අංක 14,862 හා 1969 ජූලි මස 11 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 42 වන පංතියේ වෙළඳ ලකුණක් වන අංක 30,266 හා 1968 මැයි මස 14 දින දරණ වෙළඳ ලකුණ සම්බන්ධ නිවේදනයේ, පහත සඳහන් කොන්දේසිය ඇතුළත් විය යුතුයි.

මෙම වෙළඳ ලකුණ අංක : 25724 දරණ වෙළඳ ලකුණ හා සමග නොව අංක : 10,742 සහ 30,104 දරණ වෙළඳ ලකුණු හා සංයෝජිත කරනු ලැබේ.

ජේ. ඒප්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

1969 ඔක්තෝබර් මස 5 දින,
කොළඹ 1,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

12-1228

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය.

### උපලේඛනය

**1969**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**1970**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 70. 1. 2 | සිකුරාද | ... | 69.12.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1. 9 | සිකුරාද | ... | 70. 1. 2 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1.16 | සිකුරාද | ... | 70. 1. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 1.23 | සිකුරාද | ... | 70. 1.16 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | | 70. 1.29 | බ්‍රහස්පතින්ද | ... | 70. 1.21 | බදාද | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි | ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | ... | 70. 1.28 | බදාද | ප.ව. | 3.30 |
| | | 70. 2.13 | සිකුරාද | ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.00 |
| | | 70. 2.20 | සිකුරාද | ... | 70. 2.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 2.27 | සිකුරාද | ... | 70. 2.20 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| මාර්තු | ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | | 70. 3.13 | සිකුරාද | ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 | සිකුරාද | ... | 70. 3.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 | බ්‍රහස්පතින්ද | ... | 70. 3.20 | සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි